# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු (සංශෝධන)

**2018 අංක 2 දරන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා විසින්
2024 ජූලි මස 23 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2024 මැයි මස 29 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[274 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

*2 වන වගන්තිය* : මේ වගන්තිය මගින් (මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2018 අංක 2 දරන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත සංශෝධනය කරනු ලබන අතර, මේ සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ වන "වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ" සහ "වාණිජ දෙපාර්තමේන්තුවේ" බලතල, කාර්ය සහ කර්තව්‍ය, පිළිවෙළින් "ජාත්‍යන්තර වෙළෙඳාම විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා" විසින් සහ "ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ කාර්යාලය" විසින් ක්‍රියාත්මක කරනු ලැබීම, කරනු ලැබීම සහ ඉටු කරනු ලැබීම පිණිස විධිවිධාන සැලසීම වේ.

*3 වන වගන්තිය* : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, මේ සංශෝධනය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

# ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු
# (සංශෝධන)

එල්.ඩී-ඕ. 45/2024

**2018 අංක 2 දරන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**ලුහුඬු නාමය**

1\. මේ පනත 2024 අංක       දරන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2018 අංක 2 දරන පනත සංශෝධනය කිරීම**

**2.** (1) (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2018 අංක 2 දරන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනතේ "අධ්‍යක්ෂ ජනරාල්වරයා" සහ "දෙපාර්තමේන්තුව" යන වචන යෙදෙන කවර හෝ තැනක දී, ඒ වචන වෙනුවට පිළිවෙළින් "ලේකම්වරයා" සහ "ඕඅයිටී" යන වචන ආදේශ කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(2) ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද හෝ සාදන ලද යම් දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයා" සහ "වාණිජ දෙපාර්තමේන්තුව" යන වචන යෙදෙන කවර හෝ තැනක දී, ඒ වෙනුවට පිළිවෙළින්, "ජාත්‍යන්තර වෙළෙඳාම විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා" සහ "ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ කාර්යාලය" යන වචන ආදේශ කළ යුතු ය.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය සංශෝධනය කිරීම**

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "දෙපාර්තමේන්තුව" සහ "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන යෙදුම්වල අර්ථ නිරූපණ ඉවත් කිරීමෙන්;

(2) "අමාත්‍යවරයා" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

> ""අමාත්‍යවරයා" යන්නෙන්, ජාත්‍යන්තර වෙළෙඳාම විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;";

(3) "ක්‍රියා මාර්ගයක් ගත නොහැකි සහනාධාරය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් යෙදුමේ අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

""ඕඅයිටී" යන්නෙන්, 2024 අංක දරන ආර්ථික පරිවර්තන පනතේ 99 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ කාර්යාලය අදහස් වේ;"; සහ

(4) "තාවකාලික පියවර" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

""ලේකම්වරයා" යන්නෙන්, ජාත්‍යන්තර වෙළෙඳාම විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ;".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.